# පොලිස්පති නිල කාර්යාලය

සීආර්ටීඑම් : (          ) - ආර්ටීඑම් : ( 682 )

2021.05.11

පොලිස්පති ගෙන්                    සියලු ම : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: අණදෙන නිලධාරීන් / අධ්‍යක්ෂවරුන්
: ප්‍රාදේශීය කොට්ඨාස භාර නිලධාරීන්
: දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන්
: මූ.පො.ප. / ස්ථානාධිපතිවරුන් වෙත

**අන්තර් පළාත් ගමනාගමනය සීමා කිරීම හා අවසරලත් පොදු ක්‍රියාකාරකම් කළ යුතු ආකාරය (සංශෝධනය) - 2021.05.12 දින සිට 2021.05.31 දින දක්වා**

උක්ත මැයෙන් යුතුව 2021.05.11 දිනැතිව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා විසින් නව සංචරණ සීමා පනවා ඇත.

එකී නිවේදනය මගින් දිවයින තුළ Covid - 19 වෛරස ආසාදිත රෝගීන් සංඛ්‍යාව වැඩිවන බැවින් 2021.05.12 දින සිට 2021.05.31 දින දක්වා බල පැවැත්වෙන පරිදි පළාත් අතර ගමනාගමනය සීමා කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව පහත සඳහන් තැනැත්තන් හට පළාත් අතර ගමනාගමනය සඳහා අවසර නොදිය යුතු ය.

1. විනෝද චාරිකා වල යෙදෙන්නන්
2. ආගමික කටයුතු සඳහා දුර බැහැර ප්‍රදේශ වෙත ගමන් කරන පුද්ගලයින්
3. වෙනත් පළාත් වල පදිංචි ඥාති හිතමිත්‍රාදීන් හමුවීම සඳහා ගමන් ගන්නා පුද්ගලයින්
4. විවේකය හා විනෝදය සඳහා වෙනත් පළාත් වල සිට සංචාරක හෝටල් වල නවාතැන් ගැනීමට ගමන් කරන තැනැත්තන්
5. ඉහත සනයට අයත් නොවුන සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය නොවන ගමන් හි යෙදෙන පුද්ගලයන්

ඒ අනුව ඉහත පරිදි පළාත් අතර සංචරණ සීමා පනවා නොමැති කාර්යයන් හා තැනැත්තන් සඳහා නිසි හඳුනා ගැනීමකින් අනතුරුව පළාත් සීමා හරහා ගමන් කිරීමට අවසර ලබාදිය යුතු බවට සියලු නිලධරයන් දැනුවත් කිරීමට පියවර ගන්න.

තැ. පෙ. 517, පොලිස් මූලස්ථානය, කොළඹ - 01, ශ්‍රී ලංකාව
දු.ක. 2421750, 2421111 - දිගුව : 3000 ෆැක්ස් : 2446174 ඊ-මේල්: igp@police.lk

සියලු ම පොලිස් ස්ථානාධිපතිවරුන් විසින් තම බල ප්‍රදේශයේ ඇති සංචාරක හෝටල් සහ නවාතැන්පල වලට මෙම කාලය තුළ දී පළාත් අතර සංචරණ සීමා උල්ලංඝනය කරමින් වෙනත් පළාත් වලින් පැමිණෙන සංචාරකයන් සඳහා නවාතැන් ලබා නොදිය යුතු බවට එම ආයතන හිමියන් දැනුවත් කළ යුතු ය.

එසේ ම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් විසින් පළාත් අතර සංචරණ සීමා ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩපිළිවෙලක් යාබද පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සමගින් සාකච්ඡා කර ඒකාබද්ධව ක්‍රියාත්මක කළ යුතු ය.

සී.ඩී. වික්‍රමරත්න
පොලිස්පති

සී. ඩී. වික්‍රමරත්න
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

පිටපත : ගොනුවට
මං/-